
# හා පැංචගේ හොර වැඩ



පී.එම්.ජී. ගයත්මි සහස්නා

# හා පැංචගේ හොර වැඩ

පී.එම්.ජී. ගයත්මි සහස්නා

කෘතියේ නම : හා පැංචගේ හොර වැඩ


කථාව සහ චිත්‍ර : ගයත්මි සහස්නා

කතෘගේ ලිපිනය : 3/247, නාරන්දන්ඩවත්ත,
අම්පිටිය

පාසල : මහමායා බාලිකා විදුහල

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය බී

ISBN No. : 978-624-208-384-1



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණ ගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මගේ අප්පච්චිටත් අම්මාටත්


මාගේ පාසලේ ගුරුමෑණිවරුන්ටත්

මහාමායා බාලිකාවියන්ටත්


දැයේ සියළුම දරුවන්ටත්

ආදරෙන් පුදමි

එකෝමත් එක දවසක කැලෑවක ලස්සන හා පවුලක් සමගියෙන් ජීවත් වුණා.




මේ හා පවුලේ හා අම්මයි තාත්තයි
හා දුවයි හා පුතයි ජීවත් වුණා.



හා පැන්චා හරිම දඟකාරයි. ඉතින් මේ හා පුතාටත් දඟකාරකම නිසා හැමෝම එයාට කිව්වේ දඟ පැංචා කියලා.



දවසක් මේ දඟ පැංචා හා අමමයි තාත්තයි නැති වෙලාවේ එහා ගමේ ගමරාල මාමගේ එළවළු කොටුවට ගිහින් තිබුණා.




දඟ පැංචා හොරෙන් හොරෙන් කොටුවට ඇවිත් ගමරාළ මාමගේ කැරට් පාත්තියෙන් බඩ පිරෙන්න කැරට් කෑවා.



මෙහෙම කැරට් කාපු දඟ පැංචාට ලොකු නිදිමතක් ආවා. දඟ පැංචාට දන්නෙම නැතිව නින්ද ගිහින් තිබුණා.



ගොඩ වෙලාවකට පස්සෙ අම්මයි තාත්තයි දැඟයව හොයන්න ගත්තා. අම්මයි තාත්තයි හොඳටම බය



දැන් හොදටම රෑ බෝ වෙලා දඟයට එක පාරටම නින්දෙන් ඇහැරුණා. වටපිටාව හොඳටම කරුවලයි. දඟයා හොදටම බය වෙලා.




ඉතින් දැඟයාට ආයෙත් ගෙදර යන්න පාර පේන්නෙත් නැහැ. දැඟයා අතරමං වුණා.




ගමරාල මාමාගේ කොටුවට පබරාළ කෙනෙක් හිටියා. දඟයා බය වෙලා එහාට මෙහාට දුවනකොට දඟයා දැක්කා ගමරාළව. දඟයා හොඳටම බයවුණා.



ඉතින් දඟයා බයවුණ පාර හයියෙන් කෑ ගැහුවා. දඟයා කෑ ගහන සද්දෙට දඟයාගේ අම්මයි තාත්තයි ආවා.



දෑඟයා අම්මා තාත්තා ළඟට දුවගෙන ගියා. වෙච්ච හැමදේම අම්මටයි තාත්තටයි කිව්වා.



දඟ පැංචා එයා කරපු නරක වැඩේ තේරුම් ගත්තා. කවදාවත් දඟ වැඩ හොර වැඩ නොකර ඉන්න දඟ පැංචා හිතට ගත්තා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

978-624-208-384-1